www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2008 බිඳ වැටීම හා එහි විප්ලවවාදී ඇඟවුම්

## තෙවන කොටස

**The crash  of 2008 and its revolutioíry implications -- þPart 3**

**නික් බීම්ස් විසිනි**

**2009 පෙබරවාරි 6**

*පහත පලවන්නේ ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සාමාජිකයෙකු වන නික් බීම්ස් විසින් 2009 ජනවාරි මාසයේ පවත්වන ලද සසප ගිම්හාන පාසැලට ඉදිරිපත් කරන ලද වාර්තාවේ  තෙවන කොටසයි. මෙහි 4 වන කොටස ඉදිරි දිනවල පලකෙරෙනු ඇත.*

ගෝලීය ප්‍රවිෂ්ටයක වැදගත්කම පිලිබඳව මට අවධාරනය කිරීමට අවශ්‍ය වන්නේ, එසේ නොමැතිව මහා අවපාතයේ මූලයන් හා එයට හේතුවූ කරුනු පිලිබඳව කිසිවක් අවබෝධ කර ගැනීමට නොහැකි බැවින් ය. මේවා හුදෙක් ඓතිහාසික අවශ්‍යතාවය මත නඟන ප්‍රශ්න නොවේ. ඔබාමා පරිපාලනය තමන්ගේ ඊනියා උත්තේජක වැඩ සටහන සූදානම් කරමින් සිටිය දී හා ලොව පුරා විවිධ ''වාම'' කේනීසියානු අර්ථශාස්ත්‍රඥයන් තමන්ගේ යෝජනා ප්‍රමානවත් අධිෂ්ඨානයකින් ක්‍රියාවට නඟන්නේ නම් පමනක්, දැන් එක්සත් ජනපදයේ මෙන්ම මුලු මහත් ලෝකයේ ම ධනේශ්වර ආර්ථිකයට බැට දෙන අර්බුදය ජයගත හැකියයි වාද කිරීමට වේදිකාව අරක්ගෙන සිටිය දී, සැබවින්ම මහා අවපාතය  යම් උනුසුම් දේශපාලන ප්‍රශ්නයක් බවට පත්ව තිබේ.

ආර්ථිකයේ පිරිවැය ඉහල දැමීම මත පදනම් වූ ආන්ඩුවේ මැදිහත් වීමෙන්, ධනේශ්වර ආර්ථිකයේ ගැටලු ජයගත හැකියයි පෙන්වා දීමට උත්සුක වූ අවස්ථාවේ දී ජෝන් මේනාඩ් කේන්ස්, ඔහුගේ දේශපාලන ක්‍රියා කලාපය පිලිබඳව බෙහෙවින් සංවේදී බවක් පෙන්වී ය. ඔහුගේ දේශපාලන අරමුන වූයේ සමාජවාදී විප්ලවය වලක්වා ගැනීමයි.

1933 වසරේ අග ඔහු ජනාධිපති රූස්වෙල්ට් වෙත යැවූ තම විවෘත ලිපියේ මෙසේ පැහැදිලි කලේයඃ " පවත්නා සමාජ පද්ධතියේ සැකිල්ල තුල යුක්ති සහගත යයි සලකනු ලැබූ අත්හදා බැලීම් මඟින්, සෑම රටක දී ම අපගේ තත්වයෙහි පවු සමාකර ගැනීමට බලා සිටින සියල්ලන් වෙනුවෙන්, ඔබ ඔබව ම භාරකාරයෙක් බවට පත් කර ගෙන තිබේ. ඔබ අසමත් වුව හොත් ලොව පුරාම පූර්ව නිශ්චය වී ඇති තර්කාන්විත වෙනස සඳහා සටන,සම්මතවාදයටහාවිප්ලවයටභාරවනුඇත."

1934 ජූනි මාසයේ කොලොම්බියා විශ්ව විද්‍යාලයේ පැවැත්වූ දේශනයක දී, තවදුරටත් ගැටලුව වන්නේ සෑම තනි ව්‍යවසායක් ම වැඩිපුර නිපදවන්නේ කෙසේ ද යන්න නොව, සෑම ව්‍යවසායක් ම ඊට හැකි තරමින් නිෂ්පාදනය කරද්දී සඵල ඉල්ලුම ප්‍රමානවත් අයුරින් සහතික කර ගන්නේ කෙසේ ද යන්න හා මේ "නව ගැටලුව" විසඳ නොගත්තේ නම් "සමාජයේ පවත්නා පර්යාය අපකීර්තියට පත්ව නොහික්මුනු, මුග්ධ හා විනාශකාරී වෙනස්කම් ඇතිවීම නො වැලැක්විය හැකිය."යි ඔහු පැවසීය.

කේන්ස්ට අනුව, ධනවාදයේ අර්බුදය හටගන්නේ එය තුලම පවතින නොවැලැක්විය හැකි ක්‍රියාවලීන්, ඊටත් අඩු වෛෂයික නියාමයන් ගෙන් නොව, එය නිවැරදිව වටහා නොගැනීම නිසා ය. 1931 ප්‍රකාශයට පත් කල ඔහුගේ *ඒත්තුගැන්වීමේ රචනා* නම් කෘතියේ හැඳින්වීම තුල සිය ආස්ථානය මෙසේ සංග්‍රහිත කර තිබේ. "උවමනාවේ හා දුගීභාවයේ ද, පන්තීන් හා ජාතීන් අතර ආර්ථික අරගලයේ ගැටලුව යයි යමෙකුට කෙටියෙන් කිව හැකි, ආර්ථික ගැටලුවේ ප්‍රගාඪ ඒත්තුගැනීම වනාහි, අන් කිසිවක් නොව බිය ජනක අවුලක්, අනිස්ථිර හා අනවශ්‍ය පටලැවිල්ලකි."

කේන්ස් කියා සිටියේ අර්බුදයේ හේතුව රැඳී ඇත්තේ බුද්ධිමය දෝෂය තුල බවය. එබැවින් පිලියම රැඳී ඇත්තේ නිවැරදිව විනිශ්චය කිරීම තුලය. මාක්ස්ට ඔහුගේ පිලිතුර මෙය වූ බව කේන්ස්ගේ චරිතාපදාන රචක රොබට් ස්කිඩෙල්ස්කි ගේ සටහන්වලින් පෙන්වා දෙයි. "ලාභය සුරක්ෂිත කර ගැනීමේ අටියෙන් කම්කරුවන්ගේ වැටුප් පහත හෙලීම නතරකර, ධනවාදයේ නායකයන් සිය පිලිවෙත් වෙනස් නොකලහොත්, පන්ති යුද්ධය පැන නැගිය හැකි අතර ඉන් මාක්ස් සනාථ කෙරෙනු ඇත." මෙම ප්‍රශ්න ඒවායේ අදාලත්වය කිසි ලෙසකින් හෝ අහිමි කර ගෙන නැත.

මහා අවපාතය පිලිබඳ විශ්ලේෂනය සෑම විටම ප්‍රගාඪ ලෙස දේශපාලනික වනු ඇත්තේ, කිසිදු තනි ආර්ථික සිදුවීමක් - මහා විරැකියාව, ෆැසිස්ට්වාදය හා යුද්ධය වැනි එහි බිහිසුනු ප්‍රතිවිපාකයන් ද සමඟ - වඩාත් සුපැහැදිලිව ධනේශ්වර නිෂ්පාදන මාදිලියේ ඓතිහාසික බංකොලොත් කම පෙන්නුම් කර ඇත්තේ නැති බැවින්ය.

මිල්ටන් ෆ්‍රීඩ්මාන් විසින් වර්ධනය කල විශ්ලේෂනයේ හදවතෙහි ම, දේශපාලන ගනන් බැලීම් පැවති බව නිසැක ය. 1963 දී ඈනා සික්වෝට්ස් ගේ සම කර්තෘත්වයෙන් පලකල එක්සත් ජනපදයේ මූල්‍ය ඉතිහාසය නමැති කෘතියෙන් ඒ බව පෙනී යයි. "නිදහස් වෙලඳපොල" පිලිබඳව ඉහල ම ගනයේ උපදේශකයෙක් වූ ෆ්‍රීඩ්මාන්, එවන් ව්‍යසනයක් සිදු කිරීමේ හැකියාවෙන් යුත් කිසිදු ආවේනික ගැටලුවක් ධනේශ්වර ආර්ථිකය ඇතුලත නොපවතින බව පෙන්වාදීමට උනන්දු විය. තව ද, ඔහු මාක්ස්වාදීන් පමනක් නොව, අවපාතය සැබෑ ඉල්ලුමෙහි හිඟතාවයට සම්බන්ධ කරමින් ධනේශ්වර ආර්ථිකය තුල ආන්ඩුවේ මැදිහත්වීම සඳහා කැඳවුම් කල කේන්සියානුවන් ද ප්‍රතික්ෂේප කිරීමට උත්සුක විය.

ෆ්‍රීඩ්මාන්ට අනුව අවපාතයේ අතිමූලික හේතුව, විශේෂයෙන්ම 1932 බැංකු අර්බුදය තුල ද්‍රවශීලතාවය පහත දමමින් ෆෙඩරල් මහ බැංකුව විසින් අනුගමනය කල හකුලුවා දැමීමේ මූල්‍ය ප්‍රතිපත්තිය යි. එමගින් ව්‍යාපාරික චක්‍රයේ සාමාන්‍ය පහල බැසීමක් බවට පත්විය හැකිව තිබුනු ප්‍රශ්නය, ව්‍යසනයක් බවට පත් කලේය.

ෆ්‍රීඩ්මාන්ගේ දෘෂ්ටියට අනුව මුදල් සැපයුමේ ප්‍රසාරනයකින් බිඳ වැටීම වැලැක්විය හැකිව තිබුනු අතර, ෆෙඩරල් බැංකුවේ බලධාරීන් වෙනත් පුද්ගලයින් වූයේ නම් එවැන්නක් ක්‍රියාත්මක කල හැකිව ද තිබුනි. එසේ නොවූයේ මන් ද? ෆ්‍රීඩ්මාන්, ගැටලුව 1928 නිව් යෝර්ක් ෆෙඩරල් බැංකුවේ අධිපතිව සිටි බෙන්ජමින් ස්ට්‍රෝං ගේ මරනය තෙක් ආපස්සට ගෙන යයි. ඔහුගේ වියෝව ෆෙඩරල් බැංකුවේ සමතුලිතය වෙනස් කර එය ප්‍රබල නායකත්වයකින් තොර කලේය.

මෙම හේතු දැක්වීම ඉතා ප්‍රාථමික පරීක්ෂනයකට පවා මුහුනදීමට අසමත් ය. ස්ට්‍රෝං ජීවතුන් අතර සිටියත්, බැංකුවේ ප්‍රතිපත්තීන්හි කිසිදු වෙනසක් සිදුවනු ඇතැයි විශ්වාස කිරීමට තරම් හේතු සාධක ඇත්තේ නැත. සියල්ලටත් පසුව 1930 ගනන්වල අර්බුදය පිලිබඳව බැංකුවේ ප්‍රවිෂ්ටය, අවශ්‍යයෙන් ම 1920=21 කාලයේ දරුනු හැකිලීම කෙරෙහි එහි ප්‍රතිචාරයට සමාන විය. එය බලාපොරොත්තු වූයේ "කුනාටු සහගත 20 ගනන්" වල සිදුවූ ආකාරයට ම ආර්ථිකය පන ගැන්වෙනු ඇතැයි කියා ය.

එහි බුද්ධිමය දුගී භාවය තිබිය දී ම ෆ්‍රීඩ්මාන්ගේ නිබන්ධය, එක්සත් ජනපද මහ බැංකුවට න්‍යායිකව මඟ පෙන්වා තිබේ. ෆ්‍රීඩ්මාන්ගේ 90 වන උපන් දිනය යෙදී තිබුනු 2002 දී, එවකට සිටි මහ බැංකු සභාපති පැවැත්වූ කථාව තුල, ඔහුගේ දෘෂ්ටිය සංගෘහිත කරමින් කියා සිටියේ ෆ්‍රීඩ්මාන් හා සිකවෝට්ස් ගේ විශ්ලේෂනය ප්‍රබල එකක් වූ බවයි. "මහා අවපාතය ගැන සලකන කල අපි එය කලෙමු. ඔබ නිවැරදිය, අපට සමාවන්න. එහෙත් ඔබට පින්සිදු වන්නට අපි එය යලිත් නොකරන්නෙමු."

1987 කොටස් වෙලඳපොල බිඳ වැටීම හමුවේ, එක්සත් ජනපද මූල්‍ය අධිකාරීන් පලමුව මහ බැංකුවේ ග්‍රීන්ස්පෑන්ගේ ද, ඉන් පසුව බර්නන්කේගේ ද සභාපතිත්වයෙන් ෆ්‍රීඩ්මාන්ගේ වට්ටෝරුව ක්‍රියාත්මක කලහ. සෑම මූල්‍ය අර්බුදයක් හා එලඹිය හැකි අර්බුදයක් හමුවේ ඔවුහු, පොලී අනුපාතිකයන් පහත හෙලමින් නය ප්‍රසාරනය කිරීමට පියවර ගත්හ. විසි වසරක කාලයක් සඳහා මෙම ක්‍රමවේදය පල දැරූ බවක් පෙනී ගියේය.

මූල්‍ය අර්බුද පැන නැගුනු නමුත්, මූල්‍ය වෙලඳපලවලට ද්‍රවශීලතාවය එන්නත් කිරීමේ තතු යටතේ, නව උත්පාතයක් සඳහා කොන්දේසි නිර්මානය කරමින් එවා සාපේක්ෂව ඉක්මනින් පහව ගොස් තිබේ.

කෙසේ වුව ද, ඊනියා අවමුඛ උකස් අර්බුදය හටගැනීමත් සමග, එය ම =2000=2001 කොටස් වෙලඳපල බුබුල පුපුරා යාම හමුවේ නිර්මානය කල මූල්‍ය බුබුලේ ප්‍රතිඵලයක් විය = මෙම ක්‍රම වේදයන් පල රහිත විය. ද්‍රවශීලතාවයේ ප්‍රසාරනය අර්බුදය නිමාවට පත්කිරීමට අසමත් විය. සිදුවූයේ බැංකු හා අනෙකුත් මූල්‍යායතන එකිනෙකාට නය දීමෙන් වැලකී සිටීම හමුවේ එය ගැඹුරුවීම පමනි.

"නිදහස් වෙලඳපොල" පර්යායේ සමස්ත බිඳ වැටීම, කේන්සියානුවන්ට නව ජීවයක් ලබා දී තිබේ. ඔවුන් කියා සිටින්නේ, යලිත් ආන්ඩුව මැදිහත් වෙමින් ඉදිරිපත් කරන උත්තේජක වැඩ සටහන් මගින් පමනක් අර්බුදය විසඳිය හැකි බවයි.

නව සම්මුතියේ විසඳුම් මහා අවපාතය නිමා කිරීමට අසමත් වූ බව පෙන්වා දෙන අයෙකුට ඔවුන් පිලිතුරු වශයෙන් කියා සිටින්නේ, ඒවා ප්‍රමානවත් ශක්තියකින් ක්‍රියාවට නොදැමීම ගැටලුව වූ බවයි.

1937 සැප්තැම්බරයේ සිට 1938 ජූනි දක්වා පැවති නව මසක පරිහානිය ගැන විවාදයේ දී, එම සිදුවීම් පිලිබඳව එක් ඉතිහාසඥයෙකුගේ වචනවලට අනුව " ඇමරිකානු ආර්ථික ඉතිහාසයේ පෙර නොවූ විරූ" හා සංඛ්‍යාත්මක දත්ත රැස්කිරීම ආරම්භ කිරීමෙන් පසු කුමන කාලයක හෝ දක්නට ලැබුනු තියුනු ම පරිහානිය" (කෙනත් ඩී රූස් "1937-38 පසුබෑම" ද ජර්නල් ඔෆ් පොලිටිකල් ඉකොනොමි 1948 ජූනි ) ඔවුන් අවධාරනය කලේ, 1933-37 යලි ගොඩ ඒමෙන් පසුව හට ගත් පසුබෑම, වැරදි උපදෙස් මත රූස්වෙල්ට් බදු අනුපාතිකයන් ඉහල නැංවීමේ ප්‍රතිඵලය ලෙසයි.

තව ද, කේන්සියානුවන් කියා සිටියේ, ආන්ඩුවේ යුද වියදම් හමුවේ ඇතිවූ ආර්ථික පුනර්ජීවය තම තර්කය සනාථ කරන බවයි. සැලකිය යුතු තරම් විශාල ආන්ඩුවේ වියදම්, සැබවින්ම සමාජ අවශ්‍යතා සපුරාලීම

සඳහා හසුරුවා ගැනීමට ධනවාදයට හැකියාව හා ඉඩ ප්‍රස්ථාව සැලසූ බවට ඔවුහු තර්ක කරති. මාක්ස්වාදීන් කියා සිටි ආකාරයට වත්මන් අර්බුදය ධනේශ්වර පර්යායේ නොවිසඳිය හැකි පරස්පරතාවන්ගේ නිමැවුමක් නොව, ප්‍රත්‍යක්ෂයයි කිවූ "නිදහස් වෙලඳපොල" න්‍යාය පත්‍රය වෙනුවෙන් කේනීසියානු වැඩ පිලිවෙලේ නුවනක්කාර කම පසුගිය 30 වසර පුරා ම අතහැර දමා තිබීමෙන් පැන නැංවූවකි. මා මෙම ප්‍රශ්න මහා අවපාතයේ මූලාරම්භය හා ප්‍රතිවිපාක පිලිබඳව සමාලෝචනය කරමින්, පලමුව න්‍යායිකව හා ඉක්බිතිව ඓතිහාසිකව විමසා බලන්නෙමි.

කේනීසියානුවාදයේ මූලික න්‍යායික දෝෂ මුල්බැස ඇත්තේ ධනේශ්වර ආර්ථිකයේ ස්වභාවය පිලිබඳ එහි වැරදි තක්සේරුව තුල ය. ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයේ ගාමක බලය වන්නේ පරිභෝජනය නැත්නම් ක්ෂය වූ අගය නිෂ්පාදනය කිරීම නොව, අතිරික්ත වටිනාකම් උපුටාගැනීම මගින් ප්‍රාග්ධන සමුච්ඡයයි. එබැවින් ප්‍රධාන ප්‍රශ්නය වන්නේ, ආන්ඩුවේ වියදම් ඉහල නැංවීම මත පදනම් වූ කේනීසියානු වැඩ පිලිවෙල මෙම ක්‍රියාවලිය මත කුමන බලපෑමක් ඇති කරයි ද යන්නයි. ලාභය මත ඒවායේ බලපෑම කුමක් ද?

කේනීසියානුවන්ට අනුව මූලික ගැටලුව සඵල ඉල්ලුමේ හිඟතාවයයි. ඉල්ලුමේ හිඟයක් ඇත්නම් එවිට නිෂ්පාදනය කරනු ලබන භාන්ඩ අලෙවි කල නොහැකිය. ඒවා නිපදවන ව්‍යවසායකයන්ට ඒවා අලෙවි කල නොහැක්කේ නම්, ඔවුන් නිෂ්පාදනය කපාහල යුතුය. මෙය එම ව්‍යවසායන්ම මිලට ගන්නා භාන්ඩ සඳහා ඉල්ලුම පහත වැටීමට තුඩු දෙන අතර සඵල ඉල්ලුමේ තව දුර පහල යාමක් ඇතිවේ යනාදි වශයෙනි. එසේ නම් ප්‍රධාන ප්‍රශ්නය ආර්ථිකය යලි ප්‍රසාරනය කල හැකිවන පරිදි සඵල ඉල්ලුමේ මට්ටම ප්‍රතිෂ්ඨාපනය කිරීමයි.

අපි මේ දෙස වඩා සමීපව බලමු. සඵල ඉල්ලුම යනු කුමක් ද? එය අංග දෙකකින් සමන්විත ය. පාරිභෝගික භාන්ඩ සඳහා කම්කරුවන්ගේ ඉල්ලුමත්, නිෂ්පාදන භාන්ඩ සඳහා ධනේශ්වර සමාගම්වල ඉල්ලුමත් වශයෙනි. කම්කරුවන්ගේ වැටුප් මත පදනම්ව ඇති, පාරිභෝගික භාන්ඩ සඳහා වන ඔවුන්ගේ ඉල්ලුම, ප්‍රාග්ධනයට එහි ලාභ උත්පාදනය සඳහා ප්‍රමානවත් වෙලඳපොලක් කිසි විටෙකත් සපයනු නොලබයි. මන්ද යත්, පරිභෝජනයේ මිලෙහි ප්‍රාග්ධනයට හිමි ලාභය ද අඩංගු වන බැවිනි. වෙනත් වචනවලින් කිවහොත්, සෑම විටම හටගන්නා කම්කරු පන්තියේ ඌන පරිභෝජනය ඊට හේතුවයි. මෙය ගලා එන්නේ ධනේශ්වර නිෂ්පාදනයේ ම ස්වභාවයෙනි. කම්කරුවා ලබන වැටුප, එනම් ශ්‍රම ශක්තියේ වටිනාකම සෑමවිටම කම්කරුවා නිෂ්පාදන ක්‍රියාවලියේ දී එකතු කරන අගයට වඩා අඩුය. අතිරික්ත වටිනාකමේ හා ලාභයේ උල්පත මෙම වෙනසයි.

එසේ නම් අර්බුදයේ මූලය කම්කරුවන්ගේ ඌන පරිභෝජනය විය නොහැකිය. මන්ද යත් මෙය ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයේ සදාතනික තත්වයක් වන බැවින්ය. සඵල ඉල්ලුමේ මට්ටම තීරනය කල යුතු අනෙක් උපාංගය වන්නේ, නිෂ්පාදන භාන්ඩ සඳහා ධනේශ්වර සමාගම්වල ඉල්ලුමයි. මෙම ඉල්ලුමේ මට්ටම තීන්දු කල යුත්තේ ලාභ රේට්ටුව මගිනි. ලාභ ප්‍රසාරනය වන්නේ නම් එවිට ආයෝජන වියදම් ද ඉහල යනු ඇත. ආයෝජන වියදම් ඉහල යන විට මෙම භාන්ඩ නිපදවන කර්මාන්ත තුල වැඩි වැඩියෙන් කම්කරුවන් සේවයෙහි යොදවනු ඇත. කම්කරුවන් වැඩියෙන් යොදවන කල පාරිභෝගික වියදම් ඉහල ගොස් සමස්තයක් ලෙස ආර්ථිකය ම ප්‍රසාරනය වනු ඇත.

ආයෝජනයේ තීරනාත්මක ක්‍රියා කලාපය කේන්ස් අවධාරනය කලේය. එහි පිරිහීම ඔහු දුටුවේ වෙලඳපොල තුලින් එලඹගන්නා අශුභවාදී නිගමනයන්ගේ ප්‍රතිඵලය ලෙස ය. එහෙත් ධනේශ්වර ව්‍යාපාරිකයන්ගේ මනෝවිද්‍යාව හා ආයෝජනයේ ලා ඔවුන්ගේ රුචිය තීන්දු කෙරෙන්නේ වෙලඳපොලේ ස්වභාවයෙන් නම්, අපි පැරනි ප්‍රශ්නයට ම ආපසු ගමන් කරන්නෙමු: වෙලඳපොලේ ස්වභාවය තීරනය කරන්නේ කවරෙක් ද?

වෙලඳපොල තුල සඵල ඉල්ලුමේ හිඟකම අර්බුදයේ හෝ අවපාතයේ රූපය ගැනීම පිලිබඳව කිසිදු ප්‍රශ්නයක් ඇත්තේ නැත. එහෙත් ඉල්ලුමේ හිඟකම, වෙලඳපොල තුල නොව නිමැවුම් ක්ෂේත්‍රය තුල එහි මූලාරම්භය පවතින ක්‍රියාවලියක, මතුපිට රූපය පමනි.

අපි වඩාත් සමීපව මේ දෙස බලමු. සෑම ධනේශ්වර ආයතනයක් ම වෙලඳපොලේ නියෝගයන්ට මුහුන දෙයි. සෑම ධනේශ්වර සමාගමක් ම යලිත් මුදල් බවට හරවන, කම්කරු පන්තියෙන් උපුටා ගත් හෝ වඩාත් නිවැරදිව කිවහොත්, සමස්තයක් ලෙස කම්කරු පන්තිය වෙතින් උපුටාගෙන ඇති අතිරික්ත වටිනාකමේ එකතුව බෙදාගැනීමට සහභාගී වන්නේ වෙදඳපොල තුලින් ය.

ප්‍රාග්ධනයේ කුමන සුවිශේෂී අංශයක හෝ ලාභදායීත්වය වැඩි කර ගත හැක්කේ, වෙලඳපොල සමස්තයක් ලෙස ම ප්‍රසාරනය වනනේ නම් පමනි. මෙම ප්‍රසාරනය සිදුවන්නේ ප්‍රාග්ධනයේ අනෙකුත් අංශ වඩ වඩාත් අතිරික්ත වටිනාකම් උපුටා ගැනීම තුලින් ය.

මාක්ස් එය මෙසේ සඳහන් කලේය. ප්‍රාග්ධනය සඳහා අතිරික්ක වටිනාකම් නිර්මානය කිරීම "සංසරන ක්ෂේත්‍රයෙහි ප්‍රසාරනයේ, විශේෂයෙන්ම නොකඩවා ප්‍රසාරනය වීමේ කොන්දේසියට යටත්ය. එක තැනක නිර්මානය කරන අතිරික්ත වටිනාකම හුවමාරු කල හැකිවන පරිදි, තවත් තැනක අතිරික්ත වටිනාකම් නිර්මානය කිරීම අවශ්‍ය කෙරේ. ( කාල් මාක්ස්, ගෘන්ඩ්‍රිස් 407 පිටුව)

ආන්ඩුව විසින් සෘජුව ම හෝ, වැටුප් සහන හරහා වක්‍ර ලෙස හෝ සිදුවන පාරිභෝගික වියදම් ඉහල නැංවීම, අතිරික්ත වටිනාකම් සමුච්ඡය කෙරෙහි කුමන බලපෑමක් ඇති කරන්නේ ද? එය ඉහල නංවන්නේ නැත. සැබවින්ම, ආන්ඩුවේ අතිරේක වියදම්, නය නිර්මානය කිරීම මඟින් සම්පාදනය කරන තාක් දුරට, බැඳුම්කර හිමියන්ගේ පොලී ඉල්ලීම ඉහල යාම මඟින්, දිගු කාලයේ දී ගැටලුව උග්‍ර විය හැකිය.

ආන්ඩුවේ වියදම් ඉහල දැමීම ආර්ථික ප්‍රසාරනයකට තුඩු දිය හැකිය. එනම් යම් කාලයකට ජාතික ආදායම වැඩි විය හැකිය. එහෙත් එයම, අතිරික්ත වටිනාකම් සමුච්ඡයේ හා ලාභ අනුපාතයේ ඉහල නැංවීමක් සිදු නොකරනු ඇත.

අපි වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයෙන් සාදෘෂ්‍යයක් ගෙන බලමු. තරුන හාදයෙකුට ඔහුගේ හදවත ඇනහිටුවන තරමේ විදුලි සැරයක් වැදුනොත්, හද ගැස්ම යලි පන ගන්වන ඇඩ්‍රිනලින් එන්නතකින් ඔහුගේ ජීවිතය බේරෙනු ඇත. ඇඩ්‍රිනලින් ප්‍රතික්‍රියා කරන්නේ මෙම හදවත නිරෝගී තරුනයෙකුගේ නිසා ය. එහෙත් හදවත රෝගී එකක් නම් කුමන තරමේ ඇඩ්‍රිනලින් ප්‍රමානයකින් හෝ එම ගැටලුව නොවිසඳනු ඇත.

ධනේශ්වර ආර්ථිකය තුල නිෂ්පාදන යාන්ත්‍රනය නිරෝගී නම් එනම්, එය ප්‍රමානවත් අතිරික්ත වටිනාකම් පොම්පකරන්නේ නම්, ආන්ඩුවේ වියදම් ඉහල නැංවීමේ රූපයෙන් ආර්ථික ඇඩ්‍රිනලින් වඩියකින් පුදුම දේ සිදුවිය හැකිය. එහෙත් ආර්ථික පොම්ප කිරීමේ යාන්ත්‍රනය දෝෂ සහිත නම් හෝ පලුදු වී ඇත්නම්, හෝ එසේත් නොමැතිනම් අතිරික්ත වටිනාකම් ගලා යන නාල ඝන වී ඇත්නම්, එසේ නොවනු ඇත.

මෙම න්‍යායික තක්සේරුවේ පදනම මත අපි මහා අවපාතයේ ඓතිහාසික වර්ධනයන් වෙත හැරෙමු.

1933 දී බ්‍රිතාන්‍ය අර්ථශාස්ත්‍රඥ ලයනල් රොබින්ස් මෙසේ ලිවීය: "අප ජීවත් වන්නේ ලෝක අර්බුදයේ හතරවන නොව දහනමවන වසරේය. ඉන් ඔහු අදහස් කලේ අර්බුදය පටන් ගත්තේ 1929 නොව 1914 බවය. මෙම ප්‍රවිෂ්ටය ගැනීම මඟින් අපට මහා අවපාතයේ හේතු සාධක පිලිබඳ නිවැරදි අවබෝධයක් ලබාගත හැකිය.

ප්‍රථම ලෝක යුද්ධයේ රූපයෙන් හටගත් ලෝක අර්බුදය දැනට මත් අප සටහන් කර ගෙන ඇති පරිදි, ලඟා වූයේ ධනේශ්වර වර්ධනයේ වක්‍රයෙහි සන්ධිස්ථානයක දී ය. 1890 ගනන් මැද භාගයේ පටන් වර්ධනයේ කුනාටු සහගත අවධියකින් පසුව, ලාභානුපාතික පහත බැසීමට පටන් ගත්තේ ය. මෙය හුදෙක් ව්‍යාපාරික චක්‍රයේ උච්ඡාවචනයක් නොවූ අතර, පශ්චාත් යුද්ධ අවධිය තුල යුරෝපීය ආර්ථිකය පුනර්ජීවනයක් ලැබීමට අසමත් වීම තුල, පසු කාලීනව දක්නට ලැබුන ආර්ථික වර්ධනයේ නව අවධියකි.

1920 ගනන්වල දී බොහෝ නිරීක්ෂකයන්ට, ධනවාදය ඉදිරියට යන්නේ කෙසේදැයි දැකගත හැකි විය: යුරෝපීය ආර්ථිකය ප්‍රතිනිර්මානය කල හැකි වූයේ බොහෝ කොට ම ප්‍රසාරනය මුල් කොට ගත් වඩාත් පලදායී ඇමරිකානු ක්‍රමෝපායන් ප්‍රයෝජනයට ගැනීමෙනි. යුද්ධය ම පැන නැංගේ නිෂ්පාදන බලවේගවල ප්‍රසාරනය හා ජාතික රාජ්‍ය පද්ධතියේ සීමා බන්ධනයන් අතර ගැටුම තුලිනි. මෙම ගැටුම පිටුදැකීම කෙසේ වෙතත් වර්සායි ගිවිසුම වැනි යුද්ධයේ ප්‍රතිඵල මඟින් සිදුවූයේ එය තවත් නරක අතට හැරීම පමනි.

යල් පිනූ නිෂ්පාදන ක්‍රමෝපායාන් හඳුන්වා දී තිබූ යුරෝපීය කර්මාන්තයේ ප්‍රසාරනය, තීරුබදු තාප්ප, නිෂ්පාදනය සීමා කිරීමේ ගිවිසුම් හා කාටෙල් ද ජාතික දේශසීමා ද මඟින් වට කරනු ලැබ තිබුනි.

ඒ අතර එක්සත් ජනපදය වේගවත් වර්ධනයක් අත් කර ගනිමින් තිබුනි. එහෙත් තව දුරටත් එය ස්වයංපෝෂිත නොවීය. ඇමරිකානු ආර්ථික ප්‍රසාරනය පවත්වාගැනීම සඳහා යුරෝපීය ආර්ථිකයේ ප්‍රසාරනයක් අවශ්‍ය විය. බෙහෙවින් විසල් ඇමරිකානු ධනවාදයේ නිෂ්පාදන ක්‍රමෝපායන් හරහා කම්කරු පන්තිය වෙතින් අතිරික්ත වටිනාකම් සූරාකෑමට නම්, යුරෝපය තුල අතිරික්ත වටිනාකම් සූරාකෑම ඉහල නැංවිය යුතු විය. එය සිදු නොවූ අතර එහි ප්‍රතිඵලය වූයේ 1929 ඇමරිකානු ආර්ථිකය බිඳ වැටීමයි. වෙනත් වචනවලින් කිවහොත්, අවපාතය සඵල ඉල්ලුමේ පහත වැටීමේ රූපය ගත් අතර, එහි හේතුව ඌන පරිභෝජනය නොව, සියල්ලටත් වඩා යුරෝපය තුල අතිරික්ත වටිනාකම් උත්පාදනය පහත වැටීම යි.

මහා අවපාතය එක් රටක ආරම්භ වී අවශේෂ ලෝකයට පැතිර ගිය අර්බුදයක් නොවී ය. එය, ලෝකයේ බලගතු ම නිෂ්පාදන ආර්ථිකයන් දෙක වූ එක්සත් ජනපදය හා ජර්මනිය තුල, එහි වඩාත් නාටකාකාර ප්‍රකාශනය අත් කර ගත්, ගෝලීය අර්බුදයක් විය.

බිඳ වැටීම එක්සත් ජනපදය තුල වඩාත් තියුනු ලෙස ප්‍රකාශිත වූයේ නම් ඊට හේතුව, යුරෝපීය ආර්ථිකයන් යුද්ධයෙන් පසු කාලයේ එලඹ සිටි කාලකන්නි තත්වයෙන් කිසි විටෙකත් සැබෑ ලෙස ම යලි ගොඩ නොඒම යි. ජර්මනිය තුල එය එතරම් ම තියුනු වූයේ නම් ඒ, යුරෝපීය ජාතික රාජ්‍ය පද්ධතිය මඟින් එය තරම් වෙනත් කිසිදු ආර්ථිකයක ගෙල සිර කොට නොතිබීම යි. නැගෙනහිර තුල ලබන මිලිටරි ජයග්‍රහන මගින් හුස්ම ගැනීමේ ඉඩක් (කැඇබිර්මප* විවර කරගත හැකි වේ ය යන බලාපොරොත්තුව මත, ජර්මන් ධනේශ්වරය හිට්ලර්ට පිටුබලය දුන්නේ, එම ගලග්‍රහනය පසෙකට ඇද දැමීමට දැරූ උත්සාහයක් ලෙස ය.

රූස්වෙල්ට්ගේ නව සම්මුතිය අමරිකානු ධනවාදය සඳහා නව මාවතක් විවෘත කරනවා වෙනුවට එහි අසාර්ථකත්වය, මහා අවපාතයට තුඩු දුන්නා වූ ඓතිහාසික අර්බුදය විසඳිය හැක්කේ, සමස්ත ලෝක පර්යායේ ම පූර්න ප්‍රතිව්‍යුහකරනයකින් පමනක් යයි එක්සත් ජනපද පාලක පන්තිය ඒත්තු ගැන්වීය. ඇමරිකානු කර්මාන්තයේ වඩාත් ඵලදායී විධික්‍රමයන් සඳහා මග හෙලි කර ගත යුතු විය. 1933 නොවැම්බරයේ දී ට්‍රොට්ස්කි පැහැදිලි කල පරිදි: "ඇමරිකානු ධනවාදය ඉක්මනින් හෝ පසුව තමන් සඳහා අපගේ සමස්ත ග්‍රහලෝකයේ දිගට හරහට මාවත් විවර කර ගත යුතු ය." එම කර්තව්‍යය ඉටු කර ගැනීමේ දී යුද්ධය ද ඇතුලුව අතට අසුවන සෑම මාධ්‍යයක් ම යොදාගනු ඇතැයි ඔහු ලිවීය.

ඇමරිකානු ධනවාදය සඳහා මග හෙලි කිරීමේ අර්ථය, යුරෝපීය මහාද්වීපය තුල අධිරාජ්‍යයක් ගොඩනැගීමේ ජර්මානු සැලසුම්, නැගෙනහිර තුල අධිරාජ්‍යයක් සඳහා වූ ජිනියා සම - සෞභාග්‍යයේ කරලියක් පිලිබඳ ජපන් සැලසුම් මෙන්ම, ව්‍යර්ථ කර දැමීමයි. අත්ලාන්තික් ප්‍රඥප්තිය පිලිබඳව සාකච්ඡා කිරීමට චර්චිල් 1941 දී රූස්වෙල්ට් හමුවූ විට ඔහු අවබෝධ කර ගත් පරිද්දෙන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය, එහි දොරටු වැසීම මෙන්ම අධිරාජ්‍යයට වාසි සහගත වෙලඳ හා මූල්‍ය ගිවිසුම් ද සමග, පශ්චාත් යුද්ධ ලෝකයේ ඇමරිකානු දෘෂ්ටිය තුලට ඇතුලත් කර නොගන්නා බව ද එහි අර්ථය විය.

1944 බ්‍රෙටන්වුඩ්ස් ගිවිසුම හා 1947 මාර්ෂල් සැලැස්ම තුල ප්‍රකාශයට පත්වූ පශ්චාත් යුද්ධ ප්‍රතිව්‍යුහකරනය ධනේශ්වර ප්‍රසාරනයේ නව කාල පරිච්ඡේදයක් සඳහා ආර්ථික පදනම් සම්පාදනය කලේ ය. මෙම පියවර මගින් ඉහල ශ්‍රම ඵලදායිත්වයක් හා වැඩි වැඩියෙන් අතිරික්ත වටිනාකම් සූරාකෑමේ ඇමරිකානු කාර්මික ක්‍රමෝපායන් පුලුල් කිරීම හා අවශේෂ ලෝකය කරා ඇමරිකානු ආයෝජන ප්‍රසාරනය කිරීම සඳහාත් මඟ විවෘත කලේ ය.

කෙසේ වුව ද, දශක තුනකටත් අඩු කාලයක් තුල, ධනේශ්වර නිෂ්පාදන මාදිලියේ සියලු මූලික ප්‍රතිවිරෝධයන් යලි හිස එසවීය. ඩොලර්වලට පිටුබලය සැපයුවේ යයි සැලකූ එක්සත් ජනපදය තුල රැස්කර තිබූ රත්රන්වලට සාපේක්ෂව, ලොව පුරා සංසරනය වෙමින් පැවති අතිරික්ත ඩොලර් සමගින්, බ්‍රෙටන්වුඩ්ස් මූල්‍ය පද්ධතිය 1971-73 කාලයේ බිඳ වැටීමෙහි කතාන්තරය කිව හැකිය. එහෙත් මෙය වනාහි වඩාත් මූලික ක්‍රියාවලියක මතුපිට ප්‍රකාශනය පමනකි: පශ්චාත් යුද්ධ මූල්‍ය පද්ධතියට ම ශක්‍යතාව ගෙන දුන් ලෝක ආර්ථිකයේ වර්ධනයත්, එම මූල්‍ය පද්ධතිය එක් තනි ජතික රාජ්‍යයක, අති බලගතු එක්සත් ජනපදයේ මුදල මත වූවත්, පදනම් කිරීම අතර ප්‍රතිවිරෝධය එහි පදනමයි. වෙනත් වචනවලින් කිව හොත්, ලෝක ආර්ථිකය හා ජාතික රාජ්‍ය පද්ධතියත් අතර ප්‍රතිවිරෝධය මතුපිටට පැමිනියේ ය. බ්‍රෙටන්වුඩ්ස් බිඳ වැටීම හමුවේ, ජාත්‍යන්තර මුදලක් සඳහා වූ කේන්ස්ගේ පූර්ව යෝජනාව පරිද්දෙන් ම, ප්‍රධාන ධනේශ්වර බලවතුන්ගේ එකිනෙකට විසංවාදී ජාතික ආවශ්‍යකතා මත පදනම් කල යම් වර්ගයක ප්‍රවේසම් සහගත ජාත්‍යන්තර ගිනුම් ඒකකයක්, සෑම යෝජනාවක ම එල්ලයව පැවතුනි.

අප පෙන්වා දී ඇති අනෙක් ප්‍රතිවිරෝධය ද හිස එසවීය. 1974-75 ලෝක ආර්ථික පසුබෑම ද හුදෙක් තෙල් මිල නැගීමේ ප්‍රතිඵලය නොවීය. එය අර්බුදය ගැස්සූ කොකා පමනි. එය 1960 ගනන්වල අවසානයේ පටන් ඉස්මතුවීමට පටන් ගත් ලාභානුපාතිකයේ පහත බැසීමෙන් වට ලනු ලැබ පැවතුනි. ධනේශ්වර වර්ධනයේ වක්‍රය පහත බැසීමක් තුලට ඇතුල්වී තිබුනි.

ඉන් පසු සිදුවූ වර්ධනයන් පිලිබඳව, පසුගිය දෙසැම්බරයේ පැවැත්වූ *ලෝක ආර්ථික අර්බුදය: මාක්ස්වාදී විශ්ලේෂනයක්* යන මාගේ දේශනය තුලදී මම පෙන්වා දුනිමි. එබැවින්, මූලික ප්‍රශ්නය අවධාරනය කිරීම හැරෙන්නට, එහි දී මතු කල කරුනු මෙහි දී මම පුනර්කරනය නොකරමි. 2008 දී ලෝක ධනවාදය ඇතුල්වූ බිඳ වැටීම වනාහි, වැරදි පිලිවෙත්වල ප්‍රතිඵලය හෝ කෙසේ වෙතත් දැන් නිවැරදි කල හැකිව තිබෙන, ධනේශ්වර ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ පාර්ශවයෙන් සිදුවූ යම් වැරදි වැටහීමක ප්‍රතිඵලය නොවීය. ඒවා ධනේශ්වර නිෂ්පාදන මාදිලියේ ම ආර්ථික හා ඓතිහාසික තර්කනයෙන් මතු කල හා 1970 ගනන් මුල අර්බුදය මගින් තමන් ම මුදාහැරගෙන තිබෙන ක්‍රියාවලීන්ගේ ප්‍රතිඵලය යි.

**මතු සම්බන්ධයි**

© www.wsws.org